# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බදු අභියාචනා කොමිෂන් සභාව
## (සංශෝධන)

**2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[222 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 13.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බදු අභියාචනා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව වැඩි කිරීම සහ ඒ හා සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීමයි.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරනු ලැබූ සංශෝධන වලට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් ලබාදෙන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් පාර්ශවයක් විසින් බදු අභියාචනා කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම පිළිබඳ විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 4 වන වගන්තිය මගින් කරනු ලැබූ සංශෝධන වලට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 4 වන වගන්තිය මගින් කරනු ලැබූ සංශෝධන වලට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පැහැදිලි කිරීමේ අවශ්‍යතා සඳහා සංශෝධනය කරනු ලබයි.

***8 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර මෙම අලුත් වගන්තිය මගින් අභියාචනාධිකරණය වෙත අභියාචනා කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

***9 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පැහැදිලි කිරීමේ අවශ්‍යතා සඳහා සංශෝධනය කරනු ලබයි.

***10 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර එමගින් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත සහ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ බදු අභියාචනා කොමිෂන් සභාව වෙත කරනු ලබන අභියාචනා සලකා බැලීම සඳහා විධිවිධාන සලස්වනු ලබයි.

එල්.ඩී.—ඕ 9/2013.

**2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

1. මේ පනත 2013 අංක      දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් අවසන්වරට සංශෝධිත, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ, "විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් එක් අයෙකුගෙන් ද, බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිත සහ විශිෂ්ඨත්වයක් ලත් තැනැත්තන් අතරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දෙදෙනෙකුගෙන් ද සැදුම්ලත් සාමාජිකයන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය" යන වචන වෙනුවට "විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් තුන්දෙනෙකුගෙන් ද, බදුකරණය, මූල්‍ය සහ නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිත සහ විශිෂ්ඨත්වයක්ලත් තැනැත්තන් අතුරින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් අටදෙනකුගෙන්ද සැදුම්ලත්, සාමාජිකයන් නවදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2අ)කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, කොමිෂන් සභාව ඉදිරියේ පවතින යම් කාරණයක් පිළිබඳ

විභාග කොට තීන්දුවක් ලබා දීම සඳහා, එක් එක් මූලමණ්ඩලය (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයන් අතුරින්, සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සහ ඉන් එක් සාමාජිකයෙකු (2)වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විනිශ්චයකාරවරයෙකු විය යුතු, මූල මණ්ඩල තුනක් පිහිටුවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය." යන වචන වෙනුවට "සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මඟින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"(1අ) මෙම පනතේ 1 වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ, නිශ්චිතව දක්වා ඇති යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ යම් බද්දක්,ගාස්තුවක්, අයකිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් පැනවීම හා අදාළ යම් කාරණාවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු "කොමසාරිස් - ජනරාල්වරයා වශයෙන් සඳහන් කරනු ලබන)දේශීය ආදායම් පනත ප්‍රකාරව පත්කරන ලද දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්; හෝ

(ආ) (235 වන අධිකාරය වූ) රේගුආඥාපනතේ 10 වන වගන්තියේ (1අ)උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාරණාවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු " අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්,

ලබාදෙන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකු විසින්,මෙහි මින්මතු දක්වා ඇති විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකි ය:

එසේ වුව ද, (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකුටම,එම අභියාචනය කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී ප්‍රඥප්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු බවට කොමසාරිස් - ජනරාල්වරයා විසින් තක්සේරු කර ඇති සහ එම තක්සේරුව අභියාචනයේ විෂයය කාරණය වී ඇති මුදලින් -

(අ) ආපසු ගෙවනු නොලබන සියයට දහයකට සමාන මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස; හෝ

(ආ) සියයට විසි පහකට සමාන මුදල් ප්‍රමාණයක්කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා විවෘත කරනු ලබන සහ පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට ගෙවන ලෙස හෝ කොමිෂන් සභාව විසින් අභියාචනය පිළිබඳ තීරණය කරනු ලබන තෙක් වලංගුව පවතින, එම මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක බැංකු ඇපකරයක් තබන ලෙස,

නියම කරනු ලැබිය යුතු ය.”.

(2) (1)වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :-"

(1අ) (අ) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (අ) හෝ (ආ) ඡේදවල දක්වා ඇති මුදල්ප්‍රමාණය එම මුදල් ප්‍රමාණය අදාළ වන්නේ යම් අභියාචනයක් සම්බන්ධයෙන් ද, එකී අභියාචනය නිශ්චය කළ පසු, සහඉහත කී ප්‍රඥප්ති යටතේ යම් බද්දක්, ගාස්තුවක්, අයකිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් ලෙස ගෙවිය යුතු බවට කොමසාරිස් - ජනරාල්වරයා විසින් තක්සේරු කරන ලද සහ අභියාචනයට විෂයය කාරණය වී ඇති තක්සේරු මුදල් ප්‍රමාණයට එරෙහිවඑම මුදල් ප්‍රමාණය හිලව් කළ පසු, කොමසාරිස් - ජනරාල්වරයා වෙත පවරනු ලැබිය යුතු ය.

(ආ)කොමසාරිස් - ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන, (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ)ඡේදයේ දක්වා ඇති මුදල් ප්‍රමාණයේ යම් අතිරික්තයක් ගෙවීමට නියමිත යම් බදු මුදල් ප්‍රමාණයකට හිලව් කළ යුතු ය. එම හිලව් කිරීමෙන් පසුව තවදුරටත් එම මුදලේ යම් ශේෂයක් පවතින්නේ නම් අභියාචකයා විසින්, කොමසාරිස් - ජනරාල්වරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මගින් අභියාචක වෙත එම මුදල නැවත ගෙවනු ලැබිය යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "මේ පනතේ I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ පනතේ I වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ හෝ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ප්‍රකාර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "එම දැන්වීමේ පිටපතක් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර," යන වචන වෙනුවට "එම දැන්වීමේ පිටපතක් අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර," යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** 2012 අංක 4 දරන බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) මෙම උපවගන්තියේ "කොමසාරිස් - ජනරාල්වරයා" යන වචන සඳහන් වන කවර හෝ තැනක ඒ වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) "තමා - කොමසාරිස් - ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලද හේතු සමග අතෘප්තියට පත්ව ඇත්නම්," යන වචන වල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට "තමා - කොමසාරිස් - ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලද හේතු සමග

අතෘප්තියට පත්ව ඇත්නම්, 7 වන වගන්තිය යටතේ තමාට එම හේතු ලැබුණු දින සිට දින තිහක් ඇතුළත ඒ පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින්, තත්කාර්ය සඳහා කලින් කල සාදනු ලැබිය හැකි රීතිවලට අනුකූලව එකී අභියාචනා විභාග කර විනිශ්චය කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "කොමසාරිස් - ජනරාල්වරයා" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "කොමසාරිස් - ජනරාල්වරයා විසින්" යන වචන සහ "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යන වචන සහ "I වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති හෝ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ අදාළ වන යම් විධිවිධාන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එහි (5) වන උපවගන්තියේ "I වන උපලේඛනයේ සහ II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "I වන උපලේඛනයේ I වන තීරයේ හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) එහි (8) වන උපවගන්තියේ, "කොමසාරිස් - ජනරාල්වරයා" යන වචන සඳහන් වන කවර හෝ තැනක ඒ වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයා හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (10) වන උපවගන්තියේ "තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය. කොමිෂන් සභාවේ තීරණය අභියාචකට සහ කොමසාරිස් - ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය." යන වචන වෙනුවට "තක්සේරුව ප්‍රතිශෝධනය කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(6) (10) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(11). කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වියයුතු අතර, එම තීරණය අභියාචකට සහ අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් - ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය "අභියාචනය විභාග කිරීම ආරම්භ කළ දින සිට දින දෙසීය හැත්තෑවක් ඇතුළත ලබාදිය යුතු යඃ" යන වචනවලින් ආරම්භව ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"ඒ එක් එක් අභියාචනය විභාග කිරීම සඳහා රැස්වීම් ආරම්භ කරනු ලබන දින සිට දින දෙසීය හැත්තෑපහක් ඇතුළත ලබාදිය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ 1 වන උපලේඛනයේ 1 වන තීරයෙහි හෝ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තීන්හි විධිවිධානවලට අනුව අදාළ මණ්ඩල හෝ සමාලෝචන මණ්ඩල ඉදිරියේ විභාග වෙමින් පවත්නා සියලු අභියාචනා මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුණ ද, කොමිෂන් සභාව විසින් ඒ එක් එක් අභියාචනය විභාග කිරීම සඳහා කොමිෂන් සභාව සිය රැස්වීම් ආරම්භ කරනු ලබන දින සිට මාස විසි හතරක කාල සීමාවක් ඇතුළත දී ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දිය යුතු ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

ප්‍රධාන ප්‍රඥප්තියේ 11අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනය.

11අ. (1) මේ පනත යටතේ බදු අභියාචනා කොමිෂන් සභාවේ යම් තීරණයක් අවසානාත්මක විය යුතු යː

එසේ වුව ද, (මෙහි මින්මතු මේ පනතේ " අභියාචක" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන තැනැත්තකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නීති ප්‍රශ්නයක් ගැන තීරණයක් සඳහා අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ හැකි ය. කොමිෂන් සභාවේ තීරණය අවස්ථාවෝචිත පරිදි කොමසාරිස් ජනරාල්වරයාවෙත හෝ අභියාචක වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබූ දින සිට මසක් ඇතුළත රුපියල් එක් දහස් පන්සියයක

ගාස්තුවක් ද සමග ලිඛිතව කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත භාර දෙනු නොලැබුවහොත් මිස, එවැනි ඉල්ලීමක් භාර නොගත යුතු ය.

(2)කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන කරුණු සැලකිරීමෙහි අදාළ කාරණය ද කොමිෂන් සභාවේ තීරණය දආරවුලට හේතු වූ බදු මුදල් ප්‍රමාණය රුපියල් පන්දහසකට වැඩි නම් ඒ බදු මුදල් ප්‍රමාණය දක්වා තිබිය යුතු අතර එම කරුණු සැලකිරීම ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින පාර්ශවකරු විසින් කරුණු සැලකිරීම, සැලකිරීමෙන් සහ අත්සන් කිරීමෙන් පසු දින දාහතරක් ඇතුළත අභියාචනාධිකරණය වෙත යැවිය යුතු ය.

(3) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන අදාළකිරීමේ කාර්යය සඳහා-

(අ) අභියාචනාධිකරණය වෙත මේ වගන්තිය යටතේ යොමු කරන ලද කරුණු සැලකිරීමක් පිළිබඳව හෝ එබඳු කරුණු සැලකිරීමක් විභාග කිරීමට, නිශ්චය කිරීමට හෝ එබඳු කරුණු සැලකිරීමකට සුදුස්සක් කිරීමට අදාළව අභියාචනාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන රුපියල් පන්දහසක හෝ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි ආරවුලට හේතු වූ බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් දක්වනු ලබන වැඩි මුදලක් හෝ වටිනාකම ඇති අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සියලු නඩු කටයුතු සිවිල් නඩු කටයුතු ලෙස සැළකිය යුතු යඃ

(ආ) එසේ ඉදිරිපත් කරන ලද සෑම කරුණු සැලකීරීමක්ම කොමිෂන් සභාව විසින් එයට අමුණා ඇති සියලු පොත්, ලේඛන සහ කඩදාසි සමග අභියාචනාධිකරණය ඉදිරියෙහි වූ සිවිල් නඩු කටයුත්තක තනි ඉදිරිපත් කිරීමක් ලෙස සැළකිය යුතු ය; තව ද,

(ඇ) කොමසාරිස් - ජනරාල්වරයා, අභියාචක වේ නම් නිල බලයෙන් වූ නඩුවක නඩු පවරන රජයේ නිලධරයකු ලෙස දඹහු අභියාචනයෙහි වගඋත්තරකරු වේ නම්, නිලබලයෙන් වූ නඩුවක තමාට එරෙහිව නඩු පවරන ලද රජයේ නිලධරයකු ලෙස ඔහු සලකනු ලැබිය යුතු ය.

(4)අභියාචනාධිකරණය වෙත කරුණු සැලකිරීමක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින පාර්ශවකරු විසින් ඒ කරුණු සැලකිරීම එසේ ඉදිරිපත් කරන වේලෙහි හෝ ඊට පෙර, ස්වකීය ඉල්ලීම පරිදිකරුණු සැලකිරීමක් කරනු ලැබූ බවට දැනුම් දෙමින් ලිඛිත දැන්වීමක් යැවිය යුතු අතර අනෙක් පාර්ශවයට ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙහි පිටපතක් ද සැපයිය යුතු ය.

(5) අභියාචනාධිකරණයේ ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමක්, සංශෝධනය කිරීම පිණිස, යම් විනිශ්චයකාරවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් කොමිෂන් සභාව වෙත ආපසු එවනු ලැබිය හැකි අතර කොමිෂන් සභාව විසින් ඒ අනුව කරුණු සැලකිරීම සංශෝධනය කළ යුතු ය.

(6)ඉදිරිපත් කරන ලද කරුණු සැලකිරීමෙන් පැන නගින යම් නීතිමය ප්‍රශ්නයක් අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් විසින් විභාග කොට නිශ්චය කළ යුතු අතර එම නීතිමය ප්‍රශ්නය පිළිබඳ අධිකරණයේ තීරණයට අනුව කොමිෂන් සභාව විසින් තීරණය කර තිබූ තක්සේරුව අභියාචනාධිකරණය විසින් ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය. නැතහොත් එම කරුණු පිළිබඳව අධිකරණයේ මතය සහිතව අදාළ කරුණුසැලකිරීම කොමිෂන් සභාව වෙත ආපසු එවිය හැකි ය. අධිකරණය විසින් අදාළ කරුණු සැලකිරීමෙන් එසේ ආපසු යවනු ලැබූ අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් අධිකරණයේ මතය අනුව තක්සේරුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(7) අභියාචනාධිකරණය වෙත යොමුකර ඇති නඩුවේ තීරණයක් කරන තුරු ආරවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස් - ජනරාල්වරයා විසින් අය කර ගනු ලැබිය හැකි බදු මුදල සම්බන්ධයෙන් අභියාචනාධිකරණය විසින් කොමසාරිස් - ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත පදනම්ව අතුරු තීරණය කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය ඉදිරිපිට පැවැත්වෙන යම් නීති කෘතියක දී අවස්ථාවෝචිත පරිදි අභියාචනාධිකරණයේ ගාස්තු සම්බන්ධයෙන් සහ (1) උපවගන්තිය යටතේ ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් එම අධිකරණය විසින් සුදුසු යයි සළකනු ලබන ආකාරයට එම අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(9) (6) උපවගන්තිය යටතේ අභියාචනය විසින් කරන ලද යම් ආඥාවකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමට කොමසාරිස් - ජනරාල්වරයාට හෝ වෙනත් පාර්ශ්වයකට හැකි වීමේ කාර්ය සඳහා සහ අභියාචනාධිකරණයේ තීරණවලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධාන අදාළ කර ගැනීමේ කාර්ය සඳහා -

(ආ) (6) උපවගන්තිය යටතේ අභියාචනා-ධිකරණය විසින් කරනු ලබන ආඥාවක් සහ (8) උපවගන්තිය යටතේ අභියාචනාධිකරණයේ යම් ආඥාවක් කොමසාරිස් - ජනරාල්වරයා සහ වෙනත් යම් පාර්ශ්වයක් අතර පවතින සිවිල් නඩුවක දී අභියාචනාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අවසාන නඩු තීන්දුවක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(ආ) එවැනි සිවිල් නඩුවක දී ආරවුලට තුඩු දී ඇති කාරණයේ වටිනාකම රුපියල් පන්දහසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, අදාළ නඩුවේ දී ආරවුලට තුඩු දී ඇති බදු ප්‍රමාණය වශයෙන් මණ්ඩලය විසින් රුපියල් පන්දහසකට වැඩි මුදලක් සඳහන් කර ඇති අවස්ථාවක එම සිවිල් නඩුවේ දී ආරවුලට තුඩු දී

ඇති කාරණයේ වටිනාකම එකී වැඩි මුදල ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ඇ) එම අභියාචනය සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාට නියම කරනු නොලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"13. මෙම පනතේ I වන උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තිවල විධිවිධාන වල වගන්ති හෝ කොටස් එම උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට සහ ආකාරයට මෙයින් සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 1 උපලේඛනය ඉවත් කොට ඒ වෙනුවෙන් පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"I වන උපලේඛනය

| *I වන තීරය* *ප්‍රඥප්තිවල නම්* | *II වන තීරය* *අදාළ සංශෝධන* |
|---|---|
| 1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-<br><br>(අ) 166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 යන වගන්ති ඉවත් කිරීමෙන්; සහ<br><br>(ආ) ඒ පනතේ 172 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්. |

| *I වන තීරය*<br>*ප්‍රඥප්තිවල නම්* | *II වන තීරය*<br>*අදාළ සංශෝධන* |
|---|---|
| 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත | 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-<br><br>(අ) 137 වන, 138 වන, 139 වන, 140 වන සහ 141 වන වගන්ති ඉවත් කිරීමෙන්; සහ<br><br>(ආ) ඒ පනතේ 143 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල " සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්. |
| 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත | 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-<br><br>(අ) 118 වන, 119 වන, 120 වන, 121 වන සහ 122 වන වගන්ති ඉවත් කිරීමෙන්; සහ<br><br>(ආ) එහි 124 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්තිවල "සමාලෝචන මණ්ඩලය" යන වචන වෙනුවට "2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 35 වන සහ 36 වන වගන්ති ඉවත් කිරීමෙන් එකතු කළ අගය මත බදු පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. |

| *I වන තීරය* *ප්‍රඥප්තිවල නම්* | *II වන තීරය* *අදාළ සංශෝධන* |
|---|---|
| 3. 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 8 වන වගන්තියේ "166, 167, 168 සහ 169 ය වගන්ති හැර අභියාචනාවලට අදාළXXII පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්ති හැර අභියාචනාවලට අදාළXXIII වන පරිච්ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| 4. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත. | ආර්ථික සේවා ගාස්තු පනතේ 11 වන වගන්තියේ "අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව මේ පනත යටතේ" පිළිවෙලින් අභියාචනය" යන වචන වෙනුවට "අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව 166 වන, 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්ති වල විධිවිධාන හැර මේ පනත යටතේ පිළිවෙලින් අභියාචනයක් යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| 5. 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ "තක්සේරු කිරීම, අභියාචන, අභියාචන පිළිබඳව තීරණය කිරීම සහ තක්සේරුවල අවසානාත්මක භාවය සහ ආදායම් බදු අයකරගැනීම හෝ ආපසු ගෙවීමට අදාළව දේශීය ආදායම් පනතේ XVIII සිට XXIV පරිච්ඡේද වල" යන වචන වෙනුවට තක්සේරු කිරීම, අභියාචන, අභියාචන පිළිබඳ තීරණය කිරීම සහ තක්සේරුවල අවසානාත්මක භාවය |

| *I වන තීරය* | *II වන තීරය* |
| --- | --- |
| *ප්‍රඥප්තිවල නම්* | *අදාළ සංශෝධන* |
| | සහ ආදායම් බදු අයකර ගැනීම හෝ ආපසු ගෙවීමට අදාළව දේශීය ආදායම් පනතේ සමාලෝචන මණ්ඩලය වෙත කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් 167 වන, 168 වන, 169 වන සහ 170 වන වගන්ති හැර XVIII සිට XXIV පරිච්ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය එහි 2 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"3. 2004 අංක 11 දරන මුදල් පනත
4. 2002 අංක 16 දරන හරබදු පනත"

අතීතයට බලපෑම.

**12.** (1) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයට සහ (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ වන අභියාචනා සම්බන්ධයෙන් සිදු කරන ලද සංශෝධන හැර මේ පනතේ ප්‍රධාන ප්‍රඥප්තියට මේ පනතේ විධිවිධාන මගින් සිදු කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකව පැවති බවට සලකනු ලැබිය යුතු ය.

(2) 2012 අංක 4 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට සිදු කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකව පැවති බවට සලකනු ලැබිය යුතු අතර කොමිෂන් සභාව විසින්, 2011 මාර්තු මස 31 වන දිනෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වන දින දක්වා වන කාලසීමාව තුළ දී කරනු ලබන යම් ක්‍රියාවක් හෝ ගනු ලබන යම් තීරණයක් හෝ සියලු කාර්ය සඳහා වලංගු ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**13.** පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ පනතේ කාර්ය සඳහාː-

"තක්සේරුකරු" යන්නට දේශීය ආදායම් පනතේ එයට දී ඇති එම අර්ථයම තිබිය යුතු ය;

"දේශීය ආදායම් පනත" යන්නෙන් අවස්ථාවෝචිත පරිදි 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ."

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

1(

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.